**ලංකාපුර ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

1.1 මූල්‍ය ප්‍රාකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූනි 28 දින සභාවේ ලේකම්වරිය වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු. 6,524,600 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කළ රු. 422,428 ක් වටිනා ආයුර්වේද ඖෂධ තොග ඉවත්කිරීමෙන් තොරව අවසාන තොගය ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟහිටි උසාවි දඩ රු. 192,779 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වටිනාකම රු.58,089 ක් වූ ලී බඩු හා උපකරණ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉටු කළ ව්‍යාපෘති සඳහා ලැබිය යුතු හා සභාව විසින් ගෙවිය යුතු පිළිවෙලින් රු. 1,822,078 ක් හා රු. 200,412 ක මුදලක් කර්මාන්ත ණයගැති හා ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
----------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව අවසාන ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු. 1,141,834 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් අනුව අවසාන ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු. 301,042 ක නොසැසඳීම් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 12,585,775 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 66,729,943 ක් වුයෙන් රු. 54,144,168 ක නොසැසඳීමක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාහන ලේඛනය අනුව මෝටර් රථ හා කරත්ත වටිනාකම රු. 62,015,546 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 63,742,034 ක් වූයෙන් රු. 1,726,488 ක නොසැසඳීමක් පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය ලේඛනය අනුව රු. 1,204,465 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 1,344,354 ක් වූයෙන් රු. 139,889 ක නොසැසඳීමක් පැවතුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 157,097,605 ක් වූ වත්කම් හා රු. 6,124,731 ක් වූ වගකීම් ඊට අදාල ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදීයට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසි ආදීයට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදීයට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | 2012 ඔක්තෝබර් 31 දිනැති අංක 1732/29 දරන ගැසට් පත්‍රය අනුව, තල්පොත නගරය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර 2014 අගෝස්තු 29 දින විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇතත් මෙතෙක් වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති අංක 17 | සභාව විසින් උප පත්‍රිකා ලේඛනය පවත්වාගෙන යාමට PS-21 ආකෘති පත්‍ර භාවිතා කර නොතිබුණු අතර භාවිතා කරන ලද උප පත්‍රිකා පොත් ආපසු භාරදීම සම්බන්ධයෙන් උපපත්‍රිකා ලේඛණයෙහි කිසිදු සටහනක් තබා නොතිබුණි |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ. 110 | වාර්තා කරනු ලැබුවා හෝ නොකරනු ලැබුවා වූ හෝ හානි පිළිබඳ සටහන් පවත්වාගෙන යාම සඳහා හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගොස් නොතිබුණි. |
| (ඈ) | චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි | |
| (i) | අංක අයිඒ/අයි/2002/02/ හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2015 දෙසැම්බර් 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ NCP/LG/AC/4/1/2 දරන ලිපිය | සභාව සතු කැබ් රථය සඳහා සමාලෝචිත වර්ෂයේදී අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු. 192,470 ක් වටිනා ඉන්ධන ලීටර් 2026 ක් භාවිතා කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 18,743,422 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 4,960,090 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කුලී | 1,171,200 | 637,700 | 353,559 |
| බලපත්‍ර ගාස්තු | 1,220,150 | 436,210 | - |
| වෙනත් | 11,432,831 | 17,752,655 | 15,443,125 |

2.2.2 වෙනත් ආදායම්

-------------------

වර්ෂය ආරම්භයේ හිඟව පැවති රු. 94,175 ක මුදල් හා වර්ෂය තුළ බිල්කළ රු. 1,111,276 ක මුදල්ද සමඟ අයවිය යුතු මුළු ජල ගාස්තු ආදායම රු. 1,205,451 ක මුදලින් අයකරගෙන තිබුණේ රු. 876,115 හෙවත් සියයට 72 ක් පමණි.

2.2.3 උසාවි දඩ

----------

2016 දෙසැම්බර් 31 දින වන විට අධිකරණ 02 ක් මඟින් අයකර උතුරුමැද පළාතේ ප්‍රධාන ලේකම් වෙත එවා තිබෙන රු. 5,832,366 ක හිඟ උසාවි දඩ මුදල ප්‍රාදේශිය සභාවට ප්‍රේෂණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

------------

2016 දෙසැම්බර් 31 දිනට රෙජිස්ටාර් ජනරාල්වරයා විසින් රැස් කරන ලද රු. 2,143,375 ක මුද්දර ගාස්තු ආදායමක් ප්‍රධාන ලේකම්වරයා වෙත ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම ආදායමෙන් කිසිදු මුදලක් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව ගිණුම් විෂයන් 04 කට අදාළ වසර 2 සිට 13 දක්වා කාලයකට අයත් රු. 2,063,325 ක හිඟහිටි ආදායම් අයකර ගැනීමට සභාව විසින් 2016 වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් භාවිතා කරන වාහන 02 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට සෘජු සම්බන්ධතාවයක් නොමැති ව්‍යාපෘති සඳහාද JCB යන්ත්‍රය නොමිලේ ලබා දී තිබීම නිසා සභාවට රු. 63,205ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) බීඔපී 316 II පියවර කඩකාමර අංක 1, අංක 2 සහ අංක 3, 2010 වර්ෂයේ සිට අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය මත වසාදමා තිබූ අතර එම කඩකාමර අළුත්වැඩියා කර බදු දීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද්විතීක මට්ටමේ තනතුරු 10 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02ක පුරප්පාඩු පැවති අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු 10 ක අතිරික්තයක් පැවති බව නිරීක්ෂණය වු අතර අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවු ප්‍රාථමික මට්ටමේ ඖෂධ කම්කරු තනතුරක් සඳහා නිලධාරියෙකු සහ අනුමත නිලධාරීන් ප්‍රමාණවත්ව සිටියදී රියදුරු තනතුරක් සහ සෞඛ්‍ය කම්කරු තනතුරක් සඳහා අනියම් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

(අ) පුලස්තිගම විජිත විදුහලේ ඉදිකර ඇති කිරිහලේ ක්‍රියාකාරිත්වය ඇණ හිටීම නිසා එම කිරිහල සතුව තිබූ අයි ශීතකරණ යන්ත්‍රය 2015 මාර්තු 04 වන දින ප්‍රාදේශීය සභා ගබඩාවට ගෙන ගොස් තිබූ අතර එය 2017 මැයි 08 දින වන විටත් නිෂ්ක්‍රීයව ගබඩාව තුළ පැවතුණි.

(ආ) රු.124,921 ක වටිනාකමකින් යුත් අයිතම 03 ක් අවුරුදු 03 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

-----------------------------------

2014 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර සමාලෝචිත වර්ෂයේ ඉදිකර අවසන් කරන ලද රු. 5,748,307 ක් වැයකළ කසල කළමනාකරණ මධ්‍යස්ථානය 2017 මැයි 08 දින වන විටත් කසල ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ දිනකට ජනනය වන කසල ටොන් 02 ක පමණ ප්‍රමාණයක් සභාවේ සෞඛ්‍යය කම්කරුවන් තිදෙනෙකු යොදාගෙන සුංගාවිල පරණගම පිහිටි සභාව සතු අක්කර 05 ක පමණ භූමියෙහි කසල වර්ගීකරණයකින් තොරව ගොඩගසා වරින් වර වල දමා තිබුණි. මෙලෙස කසල බැහැර කරනු ලබන ස්ථානය අලි ඇතුන් ඇතුළු වනජීවීන් ගැවසෙන ස්ථානයක් වන අතර අනාගතයේදි පාරිසරික ගැටළු

ඇතිවිය හැකි බැවින් කසල ප්‍රතිචක්‍රීයකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය නිරික්ෂණය විය.

**04 පද්ධති හා පාලන**

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) අභ්‍යන්තර විගණනය

(ඉ) ණයගැති/ණයහිමි පාලනය

(ඊ) වාහන පාලනය